## මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ විශ්වවිද්‍යාල හා ඊට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනයන්හි තනතුරේ තහවුරු කරන ලද ස්ථිර සේවකයන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් හා අදාළ ලේඛන තමා සේවය කරන ආයතනයේ ලේකම්/ ලේඛකාධිකාරී/මණ්ඩපාධිපති/අධ්‍යක්ෂ මගින් 2026.08.21 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී /ආයතන (අනධ්‍යයන) වෙත ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### 01. රියදුරු (III ශ්‍රේණිය)

අවශ්‍ය සුදුසුකම්

1. මෝටර් රථ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම සහ එම බලපත්‍රය ලබාගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) රියදුරු පළපුරුද්දක් තිබීම .

සහ

2. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) තනතුරක හෝ නුපුහුණු තනතුරක (U-PL 1) සේවය කරන අවම වශයෙන් වසර (05)ක සතුටුදායක සේවා කාලයක් ඉටු කර තිබීම සහ වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම.

වැටුප් ක්‍රමය : රු. 48,005 – 16x490 – 55,845 (මාසික) U-PL 3 (III)
කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.**

බඳවා ගන්නා ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

### 02. ට්‍රැක්ටර් ක්‍රියාකරු (III ශ්‍රේණිය)

අවශ්‍ය සුදුසුකම්

1. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) සේවකයකු නම් දැනට දරණ තනතුරේ ස්ථිර කර තිබිය යුතුය.

සහ

(i) අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

(ii) අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම සහ අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක (01) කර්මාන්ත නිපුණතා සහිත සේවා පළපුරුද්ද තිබිය යුතුය.

හෝ

2. ප්‍රථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) සේවකයෙකු නම් දැනට දරණ තනතුරේ ස්ථිර කර තිබිය යුතු අතර, කර්මාන්ත කුසලතා සහිත, අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු පහක (05) සේවා පළපුරුද්දක් තිබිය යුතුය.

*අයදුම්කරු සතුව අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද G1 කාණ්ඩයේ වලංගු රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.*

| | | |
|---|---|---|
| වැටුප් ක්‍රමය | : | රු. 44,575-16x490-52,415 (මාසික) U-PL-2 (III)<br>කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.** |
| බඳවා ගන්නා ක්‍රමය | : | වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් |

**ආයතනික චක්‍රලේඛ ලිපි අංක 06/2020 අනුව විශ්වවිද්‍යාල පද්ධතිය තුල තනතුරකින් වෙනත් තනතුරකට පත්කිරිමේදි රජයේ ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 09 වන වගන්තියට අනුව අදාල වැටුපෙහි පිහිටවනු ලැබේ.

ලේඛකාධිකාරී
මොරටුව විශ්වවිද්‍යාලය
මොරටුව
2026.08.03